# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**
**2017 අප්‍රේල් - ජූනි**
**සමාජීයවිද්‍යා පීඨය**

**පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC – E 2015**
**ග්‍රන්ථ විඥාපන පාලනය, සුචිකරණ න්‍යාය හා පරිචය**

**පළමු ප්‍රශ්නය අතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අනිවාර්ය ප්‍රශ්නය

පහත දැක්වෙන ග්‍රන්ථ විස්තර අනුසාරයෙන්

i. ප්‍රධාන සංලේඛයක් (ලකුණු 12)

ii. අතිරේඛ සංලේඛ සකස් කරන්න (ලකුණු 08)

තිමිර පටල මැද/ JENNE/ Paul Gallicol /පෝල් ගැලිකෝත් ගේ ජෙනී නවකථාවේ සිංහල පරිවර්තනය / රාජිත සේනාරත්න රාජපක්ෂ /කර්තෘ ප්‍රකාශනයකි / නුගේගොඩ /1998/රෝම අංක සහිත පිටු xv /පිටු 327/ උස සෙ.මී 21/ ISBN 955-20-22-02-9.

02. i. පුස්තකාල සුචියේ විවිධ ස්වරූප මොනවා දැයි සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08)

ii. විශ්වවිද්‍යාල පුස්තකාලයක් සඳහා වඩාත් සුදුසු කුමන ස්වරූපයේ පුස්තකාල සුචියක් දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

03. i. පුස්තකාල සුචිකරණයේ දී 'කර්තෘ' සංකල්පය විග්‍රහ කරන්නේ කෙසේද? (ලකුණු 08)

ii. ඇංග්ලෝ ඇමෙරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ දෙවන සංස්කරණයට අනුව තනි කර්තෘ සහ බහු කර්තෘ සහිත කෘති සඳහා සංලේඛ සකස් කිරීමේ දී අනුගමණය කළ යුතු ක්‍රියාමාර්ගය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

04. සභාග වගකීම සහ මිශ්‍ර වගකීම යන සංකල්ප දෙක අතර ඇති වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. i. පුස්තකාල සුචිකරණයේ දී භාවිත වන විවිධ ප්‍රමිතීන් හඳුන්වා දෙන්න. (ලකුණු 06)

ii. අන්තර්ජාතික ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය ( ISBD) සුචි සංලේඛ සම්පාදනයේ දී වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 14)

06. පුස්තකාල සුචියකින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට යාමේදී පරිගණක සුචිය කුමන කාර්යභාරයක් ඉටුකරන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකා හතරක් (04) සඳහා කෙටි සටහන් ලියන්න. (ලකුණු 20)

i. අතිරේඛ සංලේඛ

ii. වර්ගීකෘත සුචිය

iii. ආයතන යටතේ සංලේඛ කිරීම

iv. කොන්ග්‍රස් පුස්තකාලීය විෂය ශීර්ෂ ලැයිස්තුව

**********************